
# දේශපාලනයට ආ හමුදාවල අය



රන්ජන් විජේරත්න




මොන්ටේගු ජයවික්‍රම



අනුරුද්ධ රත්වත්තේ



සරත් ෆොන්සේකා



සර් ජෝන් කොතලාවල



සර් වින්ස්ටන් චර්චිල්



අයිසන්හවර්

**මා**ණ්ඩලික ආරක්ෂක ප්‍රධානි ජෙනරාල් සරත් ෆොන්සේකා සිය පදවියෙන් ඉල්ලා අස්වීමත් සමග දේශපාලන කරළියේ මහත් ආන්දෝලනයක් ඇතිවිය. ඔහු දැන් නිසැකවම ජනාධිපති ධුරය සඳහා තරඟවදින්නට දේශපාලන වේදිකාවට ප්‍රවිෂ්ටව සිටී. ඔහුගේ මෙම ඉදිරිපත් වීම දැන් උණුසුම් සාකච්ඡා, විවේචන සහ මතභේදයන්ට තුඩුදෙමින් පවතී. හමුදාවේ අයට දේශපාලනය කැපද යන්න සමහරු නගන ප්‍රශ්නයකි. මෙම ලිපියේ අදහස එය විග්‍රහ කිරීම නොව හමුදාවේ හෝ පොලීසියේ සේවයෙන් පසුව දේශපාලනයට පිවිසි පළමු තැනැත්තා ඔහු නොවන බව පෙන්නා දීමටය. එසේම අවසාන තැනැත්තාද ඔහු නොවනු ඇත.

ආරක්ෂක අංශ පසුබිමක් සහිතව දේශපාලනයට පිවිසෙන අයවලුන් වර්ග තුනකට බෙදා දැක්විය හැකිය. එනම් ආරක්ෂක අංශ සේවයේ යෙදී සිටියදීම දේශපාලනයේ නිරත වූ අය. **2.** දේශපාලනයේ යෙදීමට අවශ්‍යා නිසාම සේවයෙන් ඉල්ලා අස්වූ අය **3.** ආරක්ෂක සේවාවන්හි සේවයෙන් පසුව දේශපාලනයට පිවිසි අය.

මෙයින් ආරක්ෂක සේවයේ යෙදෙමින්ම දේශපාලනයේ නිරත වූ කිසිවෙකු ශ්‍රීලංකාවේ නැත. මෙවැනි අවස්ථා මතුවන්නේ හමුදා කුමන්ත්‍රණයකින් බලයේ සිටින රජයන් පෙරලා දැමීමෙනි. එවැනි අවස්ථා බොහොමයක් පකිස්ථානයේ බංගලා දේශයේ හෝ අප්‍රිකානු රටවල සිදු වුවද මේ වන විට එම රටවලින්ද හමුදා පාලනය ගිලිහී ගොස් ඇත. එහෙත් මියන්මාරය, ගිනිබිසව් රාජ්‍යය, ෆීජි හා තායිවානයේ අදටත් හමුදා පාලනය ක්‍රියාත්මක වෙයි.

ශ්‍රීලංකාවේද 1962 සහ 1968 දී හමුදා කුමන්ත්‍රණ දෙකක් ක්‍රියාත්මක වූ අතර ඒවා එසැණින්ම අසාර්ථක වීය. ඒවායේ සැළසුම් වී තිබුණේත් හමුදාවල මැදිහත් වීමෙන් බලයේ සිටි රජය පෙරළා දමා වෙනත් දේශපාලන කණ්ඩායමකට බලය ලබාදීමය.

ආරක්ෂක සේවයේ යෙදී සිටියදීම විධායකය සමග මතභේද ඇතිකර ගෙන ඉල්ලා අස්වූ සැනින් පුද්ගලයින් දේශපාලනයට පිවිසි අවස්ථා දෙකක් ඇත. 2001 දි අත්තනගල්ල ප්‍රදේශයේ පොලීසියක සේවය කළ පාලිත රංග බණ්ඩාර නම් පොලිස් ස්ථානාධිපතිවරයා තමා ලද ස්ථාන මාරුවට එරෙහිව නැගී සිටියේය. අවසානයේ ඔහු පොලිස් සේවයෙන් ඉල්ලා අස්වී එක්සත් ජාතික පක්ෂය යටතේ පුත්තලම දිස්ත්‍රික්ක යෙන් තරඟ වැදී පාර්ලිමේන්තුවට තේරී පත්විය.

දෙවන සිද්ධිය මතුවන්නේ ජෙනරාල් සරත් පොන්සේකා සම්බන්ධවය. ඔහුගේ දේශපාලනයට පිවිසීමේ හේතුව දැන් කවුරුත් එක්එක් ආකාරයට දැන සිටින බැවින් ඒ ගැන මෙහි දැක්වීම අනවශ්‍යය. සමහරු ඔහු කෙරෙහි සානුකම්පිකවද ඇතැම් අය ඔහුට එරෙහිවද කතා කරති. ඔහුගේ මෙම දේශපාලන ගමනේ සාර්ථකත්වය ජනවාරි 26 දා ට දැනගත හැකිය.

ආරක්ෂක සේවාවල සේවයෙන් පසුව විශ්‍රාම ගොස් දේශපාලනයට සපැමිණි බොහෝ දෙනෙක් ශ්‍රීලංකා දේශපාලනයේ සිටිති. මෙම තත්වය බොහෝ රටවලද දක්නට ඇත.

බ්‍රිතාන්‍යයේ කීර්තිමත් අගමැතිවරයෙකු වන සර් වින්ස්ටන් චර්චිල් බ්‍රිතාන්‍යයේ සිටි නාවික හමුදාපතිවරයා ය. ඇමරිකාවේ අයිසන්හවර් ජනාධිපතිවරයා ද හිටපු හමුදා නිලධාරියෙකි. 1920 දශකයේ ලංකා පාබල හමුදාවේ මේජර් තනතුරක් දැරූ ශ්‍රීමත් ජෝන් කොතලාවල ශ්‍රීලංකාවේ දේශපාලනයට බට හමුදා නිලධාරීන් අතර කැපී පෙනේ. 1953 දී අගමැති තනතුරට පත්වූ හෙතෙම පසු කලෙක විශේෂ ගැසට් පත්‍රයකින් ජෙනරාල් පදවියට උසස් කරන ලදී.

1947 පාර්ලිමේන්තුවට තේරී පත්වූ කර්නල් නුගවෙල, වැලිගම මොන්ටේගු ජයවික්‍රම, 1956 හක්මන ආසනයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වූ කර්නල් සී. ඒ. ධර්මපාල, 1960 පාර්ලිමේන්තුවට පත්වූ මහියංගනයේ කැප්ටන් සී. පී. ජේ. සෙනෙවිරත්න ඇමති පදවි පවා දැරූහ. 1968 දී සිදුවූ හමුදා කුමන්ත්‍රණය නිසා දෝශදර්ශන යට ලක්ව සිය පදවියෙන් ඉල්ලා අස් වීමට සිදුවූ හිටපු හමුදාපති වරයෙකුවූ මේජර් ජෙනරාල් රිචර්ඩ් උඩුගම 1970 දී මාතලේ ආසනය දිනා පාර්ලිමේන්තුවට තේරී පත්විය.

1970 මහියංගනය ආසනයෙන් පාර්ලිමේන්තුවට ආ එඩ්වින් වික්‍රමරත්න ගුවන් හමුදා සාමාජිකයෙකු විය. 1977 පාත දුම්බර ආසනය දිනා පාර්ලිමේන්තුවට එක්වූ ටී. බී. වේරපිටිය නියෝජ්‍ය පොලිස්පතිවරයාව සිට විශ්‍රාම ගෙන සිටියේය. මේ වනවිටත් දේශපාලන කටයුතුවල නියැලී සිටින කර්නල් අනුරුද්ධ රත්වත්ත 1988 දී ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පාර්ලිමේන්තුවට පත්ව, 1994 දී මැතිවරණයට මුහුණ දී ජය ලැබීය. එම වකවානුව තුළ හමුදා- වේ දේශපාලන නායකත්වය හෙබවූයේ ඔහුය. හිනිදුම උපාලි අමරසිරි, ත්‍රිකුණාමලයේ කේ. ඩී. කේ. එස්. ගුණවර්ධන, පොල්ගහවෙල සුනිල් රංජන් ජයකොඩි වැනි මන්ත්‍රීවරුද පොලීසියේ හා හමුදාවල සේවය කළ අය වෙති.

වත්මන් පාර්ලිමේන්තුවේ ජනක බණ්ඩාර තෙන්නකෝන් සහ චමල් රාජපක්ෂ කලක් පොලීසියේ සේවය කොට ඉල්ලා අස්වී දේශපාලනයට පිවිසි අය වන අතර දැනට ඇමති ධුර හොබවති. 2000 මැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ තරඟ වැදී ජයග්‍රහණය කොට පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කතානායක ධුරය හෙබවූ මේජර් ජෙනරාල් සරත් මුණසිංහ හිටපු හමුදා ප්‍රකාශකයාද විය. ඔහු මේ ළඟදී අසනීපව සිට මියගියේය

එසේම ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය කර්නල් රන්ජන් විජේරත්න දේශපාලනයට පිවිස සිටි කැපී පෙනෙන චරිතයකි. එජාපයේ මහලේකම් පදවිය හෙබවූ ඔහු ප්‍රේමදාස රජය යටතේ රාජ්‍ය ආරක්ෂක උප ඇමතිවරයා වීය. එකල හමුදාව තුළ දේශපාලන නායකත්වය මෙහෙයවූයේ රන්ජන්ය.

පළාත් සභා සහ පළාත්පාලන අයතන වලද හමුදා සාමාජිකයන් බොහොමයක් දැකිය හැක. මෑතකදී ත්‍රස්ත ප්‍රහාරයට ලක්ව මියගිය මේජර් ජෙනරාල් ජානක පෙරේරා උතුරුමැද පළාත් සභාවේ විපක්ෂ නායකයාව සිටි අතර වැඩිම මනාප ඡන්ද ලැබූ තැනැත්තාය.

පළාත් හා පළාත් සභා මැතිවරණ සඳහා රණවිරුවන් තරඟකිරීමේ ප්‍රවනතාවක් දක්නට ඇත. ඌව බස්නාහිර සහ දකුණ පළාත් සභාවලට තරඟ වැදුණු ආබාධිත සෙබළුන් හා රණවිරුවන් සියළු දෙනාම පාහේ ජයග්‍රහණය කළ අතර මනාප ඡන්ද වලින්ද කැපී පෙනිණ. එහෙත් දකුණු පළාත් සභා මැතිවරණයේදී හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරුන් දෙදෙනෙකුම තරඟ කළද පරාජයට පත්විය. කලක සිටම දේශපාලනයේ යෙදෙන නියෝජ්‍ය පොලිස්පති කොටකදෙනිය බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකි.

ආරක්ෂක අංශවල සේවයේ යෙදෙන කිසිවෙකුටත් දේශපාලනයේ යෙදීම හෝ දේශපාලනය කතාකිරීමද සපුරා තහනම් වේ. හමුදා සේවයේ යෙදී සිටි ලූතිනන් අමරසිරි තම පියාගෙන් පසුව 1988 මැතිවරණයට තරඟකිරීමේ අපේක්ෂාවෙන් ඡන්ද ව්‍යාපාරය පටන්ගත්තේය. ඒ වන විටත් ඔහු හමුදා සක්‍රීය සේවයේ නියුක්තව සිටි නිසා හමුදාවෙන් නීත්‍යානුකූලව අස්වන තුරු දේශපාලන කටයුතුවල යෙදීමට එවක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා ඉඩ නොදුන්නේය. කෙසේ වෙතත් හමුදාවෙන් ඉල්ලා අස්වී තරඟකොට උපාලි අමරසිරි පාර්ලිමේන්තුවට තේරී පත්විය.

1990 අග භාගයේ පටන් ආර්. ප්‍රේමදාස මහතාට එරෙහිව ජනපතිවරණයට තරඟ කිරීම සඳහා විපක්ෂයේ පොදු අපේක්ෂකයෙකු පිළිබඳ රහස්‍ය කතා මාලාවක් ඇතිවිය. සිරිමාවෝ බණ්ඩාරනායක, ගාමිණී දිසානායක, ලලිත් ඇතුළත් මුදලි වැනි නායකයන් රහසේ කතාබහ කළේ ජනප්‍රිය හමුදා නිලධාරියෙකු වූ මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ඉදිරිපත් කිරීමටය. එම සැළසුම් ව්‍යවර්ථ වූයේ ඩෙන්සිල් කොබ්බෑකඩුව මහතා ත්‍රස්ත ප්‍රහාරයකින් මියයාම නිසා ය.

ප්‍රාදේශීය වශයෙන් ආරක්ෂක සේවාවල නියුතු වූ අයට දේශපාලනයට ඒමේ අවශ්‍යතාව ඇතිවිය. බදුල්ලේ කර්නල් පී. වී. පතිරණ, හබරාදුවේ පොලිස් පරීක්ෂක සරත් ඩයස් මෙසේ මැතිවරණවලට තරඟ කළ ද දිනන්ට බැරිවිය. 1968 හමුදා කුමන්ත්‍රණයේ සැකකරුවෙකු වූ හමුදාවේ සැරයන් මේජර්වරයෙකු වූ යසරත්න අමරතුංග 1977 හෝමගම ආසනයට තරඟ කළ ද පරාජයට පත්විය.

දේශපාලනයට පිවිසි හමුදා සාමාජිකයන් වෙතින් ඉටුවූ කාර්ය භාරය සහ දායකත්වය පිළිබඳව සලකා බැලීම වැදගත් ය. කෙනෙකු නිල ඇඳුම ඉවත ලූ පමණින් ප්‍රවීන දේශපාලකයෙකු නොවන අතර සමහර විට නිල ඇඳුම තුළ වටිනා ශූර දේශපාලකයෙකු සිටිය හැකි ය.

බුරුමයේ නේවින්, ඊජිප්තුවේ නසාර්, යුගෝස්ලෝවියාවේ ටිටෝ මෙන්ම බ්‍රිතාන්‍යයේ වින්සන්ට් චර්චිල් ද තම රටේ සංවර්ධනයට කැපී පෙනෙන දායකත්වය දුන්නේය. එසේම හමුදා නායකයන්වූ ඉඩිඅමීන්, සියා උල්හක්, එර්ෂාද්, මුසාරෆ් වැනි අයගේ සේවාවන් ප්‍රශ්නයට තුඩු දී ඇත.

හමුදාවට ඇළුම් කළ, හමුදාවට කැපවූ, එසේම අවසානයේ තම සියළු දේපළ හමුදාවට පූජාකොට මියගිය ශ්‍රීමත් ජෝන් කොතලාවල අගමැතිවරයා දේශපාලනයට පිවිසෙන හමුදා නායකයන්ට මහඟු ආදර්ශයක් බව කිව යුතු ය.

*ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරි*
**♦ මේජර් වි. බි. කරුණාරත්න Oxford UK**

---

## I AM FOR HIM

Obviously this is a man who wears an **'amude'** - because he takes pride in his culture (not because he's got no cloths)

He does not wear a suit, shoes, shirt or pants - just because everybody else in colombo is wearing them.

Despite his amude and lack of footwear - he is a man with an agenda - so he needs his mobile phone.


He does not give a toss as to what the rest of the world thinks of him as he is a man with a mission.

This is raw courage.

**I would like to be led by this man - any day.**

He is my man for the Presidency.

♦ ***Channa Cabraal Lokuliyana***
**Wembley Middx UK**



මහියංගනය සිට අරලියගහ මැදුරට ආ මා සිත්ගත් අමුත්තා

**පා**රම්පරික ඇඳුම වන අමුඩයෙන් සැරසී, ආරක්ෂාවට පොරවද උරයේ දරා, මොබයිල් පෝනයක් ද අතැතිව, මහ දවල් ගිනි අව්වේ, කොළඹ ගාලුපාරේ කොල්ලුපිටියේ පාවහන්ද නැතිව ඇවිදගන යන මෙම වැදි සාමාජිකයා මහියංගනයේ සිට පැමිණ ඇතතේ ජනාධිපතිවරයා හමුවී කිසියම් වැදගත් කාරණයක් කියන්නටය. කවුරු මොනවා කිව්වත්, හිතුවත් ඔහුට කමක් නැත. මක්නිසාද, ඔහු තම වර්ගයාටද, සංස්කෘතියටද ඇළුම්කරන බැවිනි.